සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 9 - 2017

නම : ............................................. බුද්ධ ධර්මය කාලය : පැය 2යි.

**සැලකිය යුතුයි:**

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් ලකුණු 40ක් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) රෝහිණී නදියෙහි ජලය බෙදා ගැනීමට නොහැකිව ශාක්‍ය - කෝලිය දෙපිරිස අතර ඇති වූ කලහය සංසිඳවීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
(i) කාලාම සූත්‍රයයි. (ii) පරාභව සූත්‍රයයි.
(iii) කලහ විවාද සූත්‍රයයි. (iv) අරුණවතී සූත්‍රයයි.

(2) ස්වාමීන් වහන්සේලා ඉදිරියේ ශ්‍රද්ධාව හා අසීමිත ගෞරවය ප්‍රකට වන අයුරින් සිටිය යුත්තේ,
(i) බද්ධ පර්යංකයෙන් ය. (ii) අර්ධ පර්යංකයෙන් ය.
(iii) උක්කුටිකයෙන් ය. (iv) එකත්පස්ව ය.

(3) සතර ඍද්ධිපාද මැනවින් ප්‍රගුණ කළ කෙනෙකුට ආයුෂ කල්පයක් හෝ ඊට මඳක් වැඩියෙන් ජීවත් විය හැකි යැයි දේශනා කළේ,
(i) අජපාල චෛතිය අසල ය. (ii) චාපාල චෛතිය අසල ය.
(iii) සාරනන්ද චෛතිය අසල ය. (iv) අශෝක චෛතිය අසල ය.

(4) ''වරං චේ නාධිගච්ඡෙය් ය - සෙය්‍යං සදිසමත්තනෝ.......'' යන ධම්ම පද ගාථාව අයත් වග්ගය වන්නේ
(i) යමක වග්ග ය. (ii) බුද්ධ වග්ග ය. (iii) බාල වග්ග ය. (iv) අප්පමාද වග්ග ය.

(5) අන් අයගේ දියුණුව සහ සතුට දැක තමන් ද සතුටු වන ගුණය වන්නේ,
(i) මුදිතා ගුණයයි. (ii) කරුණා ගුණයයි. (iii) මෙත්තා ගුණයයි. (iv) උපේක්ඛා ගුණයයි.

- **අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල ''අ'' කොටසේ ප්‍රකාශවලට ගැළපෙන ප්‍රකාශය ''ආ'' කොටසින් තෝරා එහි අක්ෂරය වරහන් තුළ යොදන්න.**

| ''අ'' කොටස | | | ''ආ'' කොටස |
|---|---|---|---|
| (6) කායික නිරෝගීතාවය | ( ) | A | ධම්මචරියා |
| (7) මහා සංසරත්නයේ ජීවිතය පවත්වා ගෙන යන්නේ | ( ) | B | පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි |
| (8) සදාචාරය යන්නට බුදු දහමේ | ( ) | C | අෂ්ට ගරු ධර්ම |
| (9) මහා ප්‍රජාපතී ගෝතමී දේවිය | ( ) | D | අත්තස්සද්වාර ජාතකය |
| (10) නවලෝකෝත්තර ධර්මය | ( ) | E | සිව්පසය |

v **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**
**(හේතුඵල, නිවී, සීලයේ, සතර මහෝපදේශ, වීර්ය)**

(11) හිරි ඔත්තප්ප දෙක ........................................................................................ පදනම වේ.

(12) භෝග නගරයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ධර්ම, විනය, නිවැරදිව අවබෝධ කර ගැනීම සඳහා ................................................ දේශනා කළහ.

(13) වැදගත් ප්‍රතිඵලයක් අත්පත් කර ගැනීමේ අසහාය හස්තය වන්නේ ප්‍රඥාවෙන් මෙහෙයවනු ලබන ......................................................... ය.

(14) ලෝකයේ සෑම දෙයක්ම සිදු වන්නේ .......................................................... ධර්මයට අනුව ය.

(15) බුද්ධ පරිනිර්වාණය නම් හාත්පසින්ම සමස්ත වශයෙන්ම ................................................................. යෑමයි.

v **අංක 16 සිට 20 තෙක් දැක්වෙන ප්‍රකාශ හරි නම් ( 3 ) ලකුණ ද වැරදි නම් ( 8 ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

(16) බුදුරජාණන් වහන්සේ පළමු වරට කිඹුල්වත් පුරයට වැඩම කළ දින රජ මාලිගයේ දී දෙසූ දහම් අසා මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවා ය. (     )

(17) සිත, කය, වචනය සංවර කර ගැනීම සීලය නම් වේ. (     )

(18) බුදුදහම අනුව සත්ත්වයාගේ පිරිසිදු බව හෝ අපිරිසිදු බව තීරණය කෙරෙන්නේ ඔවුනොවුන් කරන, කියන, සිතන පිළිවෙළ පදනම් කරගෙන ය. (     )

(19) ප්‍රචණ්ඩත්වය ලෙස සැලකෙන්නේ අනුන් තලන, පෙලන, බිය ගන්වන, දේපළවලට හානි පමුණුවන, හිංසා සහගත සෑම පරුෂ ක්‍රියාවන් ය. (     )

(20) 'ආපාන' යනු ප්‍රාශ්වාසයයි. (     )

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

v පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) 2017 වර්ෂයේ වෙසක් පොහොයට අදාළව ඔබ පාසලේ සිදු කළ සීල භාවනාමය වැඩසටහන ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) විදුහල්පතිතුමා විසින් සීල භාවනා වැඩසටහන සඳහා ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.

(ii) මෙවර වෙසක් පොහොය ශ්‍රී ලාංකිකයන්ට විශේෂයෙන් වැදගත් වීමට හේතුව කුමක්ද?

(iii) ඔබ සවන් දුන් ධර්ම දේශනයෙහි ඇතුළත් සේඛියා ධර්ම දෙකක් ලියන්න.

(iv) මහා මංගල සූත්‍රය ඇසුරින් කරන ලද ධර්ම දේශනයෙහි ඇතුළත් මංගල කරුණු දෙකක් ලියන්න.

(v) භාවනා වැඩ සටහනේ දී පිරිමි ළමුන් හා ගැහැනු ළමයින් වාඩිවීම සඳහා අනුගමනය කළ ඉරියව් දෙක නම් කරන්න.

(vi) එදින ඔබ සවන් දුන් ධර්ම සාකච්ඡාවේ මාතෘකාව කුමක්ද?

(vii) සීල භාවනා වැඩසටහනින් පසුව වෙසක් පොහොයට සමගාමීව ඔබ සිදු කරන ලද ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(viii) සීල භාවනා වැඩසටහනට අමතරව ඔබගේ පාසලේ ක්‍රියාත්මක කළ වැඩසටහන් දෙකක් ලියන්න.

(ලකුණු 2 x 8 = 16 )

(2) (i) විහාරස්ථානයක දී ඔබ පිළිපදින වත් පිළිවෙත් දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) ''වත්තං න පරිපූරෙන්තෝ න සීලං පරිපූරති'' යන පාලි පාඨයෙහි අදහස ලියන්න. (ලකුණු 4)

(iii) අර්ථවත්ව වන්දනා හා වතාවත්වල යෙදීමෙන් ඔබගේ ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(3) (i) ආනාපානසති භාවනාව හඳුන්වන්න. (ලකුණු 2)

(ii) සුප්ප බුද්ධං පබුජ්ඣන්ති යන ගාථාව සම්පූර්ණ කර ලියා එහි තේරුම ද ලියන්න. (ලකුණු 4)

(iii) ආනාපානසති භාවනාව වැඩීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලබා ගත හැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු 5)

(4) (i) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ හතරක් ලියන්න. (ලකුණු 2)

(ii) අෂ්ට ගරු ධර්මවලින් හතරක් ලියන්න. (ලකුණු 4)

(iii) පාසල් සිසුවෙකු ලෙස අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීම සඳහා අධිෂ්ඨානයෙන්, බුද්ධිමත්ව හා කැපවීමෙන් යුක්තව කටයුතු කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 5)

(5) (i) බෞද්ධයන් වන අපට ඉතා වැදගත් රත්න තුන නම් කරන්න. (ලකුණු 2)

(ii) ගිහියන් විසින් භික්ෂූන් වහන්සේලාට ඉටු කළ යුතු යුතුකම් කීයද? ඒවා මොනවාද? (ලකුණු 4)

(iii) අප භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කරගත යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

(6) (i) සිරිත් හා විරිත් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

(ii) ''යමෙක් තමාගේ සැප බලාපොරොත්තුවෙන් තමා සේම සැප කැමති කවර හෝ ජීවියෙකු දණ්ඩෙන් නොපෙළයි ද, හෙතෙම පරලොව දී සැප ලබයි.'' යන අදහස ඇතුළත් ධම්ම පද ගාථාව ලියා දක්වන්න. (ලකුණ 4 )

(iii) සත්ත්ව හිංසනය වැළැක්වීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

(7) (i) 'ප්‍රචණ්ඩත්වය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(ii) දස කුසල් හතරක් ලියන්න. (ලකුණු 4)

(iii) කායික නීරෝගීතාව ඇති කර ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

### බුද්ධ ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | - (iii) | (6) | D | (11) | සීලයේ | (16) | ( 4 ) |
| (2) | - (iv) | (7) | E | (12) | සතර මහෝපදේශ | (17) | ( 8 ) |
| (3) | - (ii) | (8) | A | (13) | වීර්යය | (18) | ( 4 ) |
| (4) | - (iii) | (9) | C | (14) | හේතුඵල | (19) | ( 4 ) |
| (5) | - (i) | (10) | B | (15) | නිවී | (20) | ( 4 ) |

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

(1) (i) සුදුසු පිළිතුරට අදාළ ලකුණු ලබාදෙන්න.

(ii) ජාත්‍යන්තර වෙසක් උත්සවය ශ්‍රී ලංකාවේදී පැවැත්වීම.

(iii) නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න.

(iv) මංගල කරුණු 38න් දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(v) අර්ධ පර්යංකය - ගැහැණු ළමුන්
බද්ධ පර්යංකය - පිරිමි ළමුන්

(vi) අදාල පිළිතුරට ලකුණු ලබාදෙන්න.

(vii) සිසුන් නිවසේදී කරන ලද ක්‍රියාකාරකම් දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(viii) පාසලේ සිදු කළ වැඩසටහන් දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(2) (i) අත් දෝවනය කිරීම, මළු ඇමදීම, සීලයක පිහිටා වන්දනා කිරීම, ආදි වශයෙන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න.

(ii) ''වත් පිළිවෙත් නොපුරන්නාගේ සීලය සම්පූර්ණ නොවෙයි.''

(iii) බෞද්ධයන් වන අපි විවිධ වන්දනා හා වතාවත්වල යෙදෙමු. අප වන්දනා හා වත් පිළිවෙත් කොතෙක් කළ ද , ඒවා ශ්‍රද්ධාවෙන් හා ගෞරවයෙන් ඉටු නොවන අවස්ථා ඇත. බෞද්ධකම අර්ථවත් වන්නේ ඒවා නිවැරදිව ඉටු කරන්නේ නම් පමණි. නිවස, පාසල, විහාරස්ථානය යන ස්ථානවල විවිධ වත්පිළිවෙත් සිදු වේ. ඒවා බුදුදහමින් පෝෂණය වී තිබේ. සීලයෙන් සම්පූර්ණ වීමට නම් ගිහි පැවිදි සියල්ලන්ම වත් පිළිවෙත් අනුගමනය කළ යුතු වේ. හම වන්දනා හා වතාවත් නිවැරදිව ඉටු කරන විට අපට යහපතක්ම වෙයි. එමෙන්ම මනා කළමනාකරණය, පරිසර සංරක්ෂණය, කායික මානසික නිරෝගීතාවය, චාම් බව, සැහැල්ලු බව ආදී බොහෝ දේ අපට බෞද්ධ වත් පිළිවෙත් ඇසුරින් ජීවිතයට එකතු කර ගත හැකිය. (ආදී වශයෙන් ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.)

(3) (i) ඉබේ සිදුවන ආශ්වාස හා ප්‍රාශ්වාස දෙක සිහියෙන් බලමින් කරන භාවනාව ආනාපානසති භාවනාව වේ. යන අදහස ඇතුළත් කර ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

(ii) සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතම සාවකා
යේසං දිවා ච රත්තෝ ච
භාවනාය රතෝ මනෝ
තේරුම:-
දිවා රෑ දෙකෙහිම, භාවනාවට යොමු වූ ගොයුම්ගොත් සව්වෝ, හැමදා හොඳින් පිබිදෙති.

(iii) ආනාපානසති භාවනාව වැඩීමෙන්.
හෘදයාබාධ, ස්වසන රෝග වැනි රෝග සුව වීමට උපකාර වීම.
දුක් දොම්නස් බැහැර කළ හැකිවීම.
නුවන දියුණු වීම.

සිත හා කය සැහැල්ලු වී අපමණ සුවයක් දැනීම.
කායික, මානසික නිරෝගීතාවය ඇතිවීම.

ඉහත ප්‍රයෝජන ඇතුළත් කර ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

(4) (i) අනතිමානී ගුණය, ආත්මාර්ථකාමීත්වයෙන් තොරවීම, නිරහංකාරකම, කැපවීම, නායකත්වය, නොපසුබස්නා උත්සාහය, සාමකාමී බව ආදී වශයෙන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

(ii) අෂ්ට ගරු ධර්මඃ-

01. උපසම්පදාවෙන් සියවස් මෙහෙණියක් වුව ද එදින උපසම්පදා වූ භික්ෂුවට වැඳුම් පිදුම් කළ යුතුය.
02. භික්ෂූන් නැති ප්‍රදේශයක වස් විසීම නොකළ යුතුය.
03. අඩ මසකට වරක් භික්ෂූන් වෙත පැමිණ අවවාද අනුශාසනා ලද යුතුය.
04. වස් අවසානයේ උභතෝ සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතුය.
05. ගරු ඇවැත්වලට පැමිණි භික්ෂුණිය උභතෝ සංඝයා ඉදිරියේ මානත් පිරිය යුතුය.
06. වර්ෂ 2ක් හික්මවීමෙන් පසු සාමණේරී උපසම්පදාව කළ යුතුය.
07. කිසිම අයුරකින්වත් භික්ෂුණියක් භික්ෂුවකට දොස් නොකිව යුතුය.
08. භික්ෂූන්ට භික්ෂුණීන් විසින් අවවාද නොකළ යුතුය. එසේම භික්ෂූන් විසින් භික්ෂුණීන්ට අවවාද කළ යුතුය.

(iii) ලියා ඇති පිළිතුරු සමස්තයක් වශයෙන් සලකා බලා ලකුණු ලබාදෙන්න.

(5) (i) බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය

(ii) 05 යි.

01. මෛත්‍රී සහගත කාය කර්මයෙන්
02. මෛත්‍රී සහගත වාග් කර්මයෙන්
03. මෛත්‍රී සහගත මනෝ කර්මයෙන්
04. ගේ දොර සඟරුවනට විවෘතව තැබීමෙන්
05. සිව්පසයෙන් උපස්ථාන කිරීමෙන්

(iii) ලියා ඇති පිළිතුරු සමස්තයක් වශයෙන් සලකා බලා ලකුණු ලබාදෙන්න. (පෙළ පොතේ පිටු අංක 76 සහ 77 බලන්න.)

(6) (i) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබාදෙන්න.

(ii) සුඛකාමාති භූතානි - යෝ දණ්ඩේන න හිංසති අත්තනෝ සුඛමේසානෝ -පෙච්ච සෝ ලභතේ සුඛං

(iii) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබාදෙන්න.

(7) (i) ප්‍රචණ්ඩත්වය ලෙස අදහස් කරන්නේ අනුන් තලන, පෙලන, බිය ගන්වන, දේපළ වලට හානි පමුණුවන හිංසා සහගත සැඩ පරුෂ ක්‍රියාවන් ය.

(ii)
01. ජීවීන් විනාශ කිරීමෙන් වැළකීම.
02. සොරකම් කිරීමෙන් වැළකීම.
03. ලිංගික අනාචාරයෙන් වැළකීම.
04. බොරු කීමෙන් වැළකීම.
05. කේළාම් කීමෙන් වැළකීම.
06. රළු පරුෂ වචනවලින් වැළකීම.
07. නිරර්ථක වචන කීමෙන් වැළකීම.
08. දැඩි ලෝභයෙන් වැළකීම.
09. වෛර සහගත, තරහ සහගත සිතුවිලිවලින් වැළකීම.
10. මිත්‍යා දෘෂ්ටියෙන් හෙවත් වැරදි පළිගැනීම්වලින් වැළකීම.

(iii) ලියා ඇති පිළිතුරු සමස්තයක් වශයෙන් සලකා බලා ලකුණු ලබාදෙන්න. (වැඩි විස්තර සඳහා පෙළ පොතේ පිටු අංක 90,91,92 බලන්න.)